**නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන - 2017**

**------------------------------------------------------------**

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3119 එස්ආර්අයි සහ 3120 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවෙහි 4.04 (අ) වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම වාර්තාව නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය හා අනෙකුත් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වැඩසටහනේ වියපැහැදම් සම්බන්ධ දර්ශක මත කරන ලද කාර්යයන් පිළිබඳ අදහස් දැක්වීම්වලින් සමන්විතය. සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වල මූල්‍ය ප්‍රකාශන මත මාගේ වාර්තාවන් වෙන වෙනම නිකුත් කර ඇත.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය

**------------------------------------------------------------------------------------------**

වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල අනුව, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතන 09 වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. කෙසේ වුවද, ක්‍රියාත්මක කිරීමේ ආයතනයක් ලෙස මූලිකව හඳුනාගත් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සමාලෝචිත වර්ෂයේදී ඉන් ඉවත් කර තිබුණි. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල අනුව, 2020 වනවිට දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපලේ ඉල්ලුම සැපිරීමට කාර්යක්ෂම අධ්‍යාපන පද්ධතියක් ගොඩනැගීම හා  වෘත්තීය පුහුණුව සඳහා තත්ත්වය, අදාළතාවය, ප්‍රවේශය, පිළිගැනීම මෙන්ම උපකාරක ප්‍රතිපත්ති, පද්ධති හා ආකෘති වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 125,916 කට සමාන එජඩො මිලියන 961.2 ක් වූ අතර ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය ඉන් රු.මිලියන 13,100 කට සමාන එජඩො මිලියන 100 ක් බැගින් ලබාදීමට අපේක්ෂිතය. තවද, රු.මිලියන 5,423 කට සමාන එජඩො මිලියන 41.40 ක් ජර්මානු රජය සහ කොරියාවේ අපනයන හා ආනයන බැංකුව විසින් ලබාදීමට අපේක්ෂිතය. ඊට අමතරව රු.මිලියන 26,200 කට සමාන එජඩො මිලියන 200 ක් අනෙකුත් ප්‍රභවයන් විසින් මූල්‍යායනය කිරීමට අපේක්ෂිතය. වැඩසටහන එහි කටයුතු 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2020 වර්ෂය වනවිට නිම කිරීමට නියමිතය.

## 1.3 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------------------**

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක  කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන

අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සහ තාක්ෂණික අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා අර්ධ ස්වායත්ත ආයතන හතෙහි වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ වෘත්තීය පුහුණු අංශයේ ආයතන 8 හි හා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආපසු ගැනීම් ක්‍රියාවලිය වැඩසටහනේ අනෙක් සංවර්ධන සහයක මූල්‍යයනය කරන ප්‍රමාණය හැර වියදම් කළ හැකි ප්‍රමාණය ඉක්මවා නොතිබුණු බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

විගණනයේදී පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, තෘතීයික හා අධ්‍යාපන කොමිෂන් සභාව සහ නිපුණතා ආංශික සංවර්ධන අංශයේ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශනයේ දැක්වෙන මුදල් හා මුදල් හා සමාන දෑ වල 2017 ජනවාරි 01 දිනට සමුච්චිත ශේෂය වූ රු.මිලියන 109.02 ක අගය 2016 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑවල ශේෂය ලෙස දැක්වෙන රු.මිලියන 80.04 ක අගය හා එකඟ නොවිනි.

(ආ) ජාතික තරුණ සේවා සභාව විසින් ගෙවන ලද රු.මිලියන 34.24 ක පාරිතෝෂික මුදල ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශනයට ගෙන නොතිබුණි. තවද, වැරදි ගිණුම්කරණ සටහන් හේතුවෙන් ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශනයේ දැක්වෙන කුලී පිරිවැය, වරිපනම්, තැපැල් හා දුරකථන වියදම් හා අනෙකුත් පුනරාවර්තන වියදම් රු.මිලියන 2.32 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ලංකා ජර්මානු කාර්මික පුහුණු ආයතනය විසින් සිදුකර තිබූ වැරදි ගිණුම්කරණ සටහන් හේතුවෙන් ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශනයේ දැක්වෙන ආදායම් හා වියදම් රු.මිලියන 24.97 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2018 ජූලි 15 දින වන විටත් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණු අතර එමනිසා ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශනයේ දැක්වෙන තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් හා සැසදීමට නොහැකි විය.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා හා සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මධ්‍යම මට්ටම සඳහා ණය ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා කරන ලද වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | |
|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2017 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසංබැ | 100.00 | 13,100 | | | 87.01 | 12,246 |
| ජාසංසං | 100.00 | 13,100 | 11,782 | 9,554 | 41.23 | 6,063 |
| ශ්‍රීලංර | 519.80 | 68,093 | | | 187.70 | 28,691 |
| ජර්මානු රජය | 15.40 | 2,017 | - | - | 7.47 | 1,232 |
| කොරියානු එක්සීම් බැංකුව | 26.00 | 3,406 | 500 | 220 | 7.26 | 1,077 |
| වෙනත් | 200.00 | 26,200 | | - | | - |
| **එකතුව** | **961.20** | **125,916** | **12,282** | **9,774** | **330.67** | **49,309** |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ රු.මිලියන 12,282 ක අයවැයගත වෙන්කිරීම් වලින් රු.මිලියන 9,774 ක් හෙවත් සියයට 79.6 ක් උපයෝජනය කර තිබුණි.

(ආ) ණය ගිවිසුම අනුව, රු.මිලියන 9,739.22 කට සමාන එස්ඩීආර් මිලියන 32.60 (එජඩො මිලියන 50) ක මුදලක් 2017 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුව විසින් වෙන් කරන ලද මුදලින් ප්‍රතිපූර්ණය කර ගැනීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත් රු.මිලියන 5,965.17 කට සමාන එස්ඩීආර් මිලියන 29.34 ක් පමණක් (එජඩො මිලියන 45) එදිනට උපයෝජනය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

-----------------

වැඩසටහනේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, ණය ප්‍රදාන උපයෝගී කරගෙන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන 08 ක් හා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ නිපුණතා ආංශික සංවර්ධන අංශය හරහා වැඩසටහන් 73 ක් ව්‍යාපෘති සම්බන්ධ දර්ශක 9 යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව තිබුණි. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලද තොරතුරු අනුව, ආසියානු සංවර්ධන බැංකුවේ ණය ප්‍රදාන උපයෝගී කරගෙන ව්‍යාපෘති දර්ශක 3 යටතේ ක්‍රියාත්මක කල යුතුව තිබූ ක්‍රියාකාරකම් 23 කින් ක්‍රියාකාරකම් 03 ක ඉලක්ක 2017 දෙසැම්බර් 31 දිනට ලඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල අනුව, ශ්‍රී ලංකාවේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය මෙන්ම පුහුණුවල ගුණත්වය හා තත්ත්වය වැඩිදියුණු කිරීම වැඩසටහනේ අවසන් ප්‍රතිඵලය විය යුතුය. එමනිසා කාර්මික වෘත්තීය හා පුහුණු ආයතන විසින් දැනට පවත්වාගෙන යනු ලබන පාඨමාලා, රටේ පවතින තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය මෙන්ම පුහුණුව ජාත්‍යන්තර තත්ත්වය තහවුරු වන පරිදි ජාතික වෘත්තීය සුදුසුකම් (එන්වීකියු) මට්ටම දක්වා පාඨමාලා නිතිපතා වැඩි දියුණු කිරීමට හා සමාලෝචනයට කටයුතු කළ යුතුය. ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන විසින් වර්තමානයේදී පවත්වනු ලබන පුහුණු වැඩසටහන් 3,719 කින්, 2017 දෙසැම්බර් 31 දිනට පුහුණු පාඨමාලා 1,454 ක් ප්‍රතිනනය කර නොතිබුණු බව අනාවරණය විය. එය රේඛීය අමාත්‍යාංශය විසින් පුහුණු පාඨමාලා දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීමට පියවර ගෙන නොමැති බව පැහැදිලි විය.

(ඇ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පුහුණු පාඨමාලා පවත්වනු ලබන වෘත්තීය පුහුණු ආයතනවල ජාතික වෘත්තීය සුදුසුකම් ලඟාකර ගැනීම සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම හා සහතික කිරීම සඳහා වගකිව යුතු ආයතනය වන අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 02 මුදලක් වෙන්කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ලැබී තිබෙන තොරතුරු අනුව, දිවයින පුරා පවතින වෘත්තීය පුහුණු ආයතන 1,614 ක් අතරින් 2017 දෙසැම්බර් 31 දින වන විට සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කර තිබෙන තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකපත් 74 ත් ඇතුළත්ව වෘත්තීය පුහුණු ආයතන සඳහා එවැනි සහතික පත් 170 ක් පමණක් නිකුත් කර තිබුණි.

(ii) වෘත්තීය පුහුණු ආයතන තත්ත්ව සහතික කිරීමේ කාර්යයන් සඳහා පිළිපැදිය යුතු ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා කොමිෂම ප්‍රධාන විගණකවරුන් බඳවා ගැනීමට කටයුතු කර තිබුණද, නිලධාරීන් අතර රාජකාරී සමානව බෙදාහැර නොතිබුණි. එම නිසා බාහිරව බඳවාගත් ප්‍රධාන විගණකවරු 10 දෙනා කිසිදු විගණනයක් සිදුකර නොතිබූ අතර අභ්‍යන්තරව බඳවාගත් ප්‍රධාන විගණකවරු සමාලෝචිත වර්ෂය තුල 27 සිට 35 දක්වා පරාසයක විගණනයන් සිදුකර තිබුණි.

(ඈ) ලද තොරතුරු අනුව, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සමාලෝචිත වර්ෂය තුළ සිසුන් 549 ක් බඳවා ගැනීමට ඉලක්ක කර තිබුණද, සහතික පත්‍ර පාඨමාලා 07 ක් සඳහා සිසුන් 243 දෙනෙකු ලියාපදිංචි වී තිබුණි. තවද, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ මඩකලපුව, යාපනය හා ත්‍රිකුණාමලය අධ්‍යයන

මධ්‍යස්ථානවල සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලාවක් පවත්වා නොතිබුණි.

(ඉ) වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ල අනුව, 2020 වන විට දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපලේ ඉල්ලුම සපුරාලීමට කාර්යක්ෂම අධ්‍යාපන ප්‍රතිපත්තියක් ගොඩනැගීම හා වෘත්තීය පුහුණුව සඳහා තත්ත්වය, අදාළතාවය, ප්‍රවේශය, පිළිගැනීම මෙන්ම උපකාරක ප්‍රතිපත්ති, පද්ධති හා ආකෘති වැඩිදියුණු කිරීම අපේක්ෂා කර තිබුණි. එමනිසා තරුණ පරම්පරාවේ නව රැකියා අවස්ථා වැඩිකර ගැනීම සඳහා දේශීය හා විදේශීය රැකියා වෙළඳපලේ සමීක්ෂණයක් සිදුකිරීම අත්‍යාවශ්‍ය වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වෘත්තීය පුහුණු අධිකාරිය අංශ 18 කට අදාලව වෘත්තීය පුහුණු පාඨමාලා අඛණ්ඩව පවත්වා තිබුණද, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ උපදේශකත්වය සමග ශ්‍රම වෙළඳපලේ තත්ත්වය සොයා බැලීමට හා ශ්‍රම වෙළඳපලේ කුසලතා පරතරය හඳුනාගැනීමට සහ කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන පුහුණු පාඨමාලා සඳහා ඉලක්ක ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ii) වෘත්තීය පුහුණු අධිකාරියේ සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව, විදේශීය රැකියා අවස්ථා වැඩිකරලීමේ අරමුණු වෙනුවෙන් නව පුහුණු පාඨමාලා හඳුනාගැනීමට, සංවර්ධන කිරීමට හා ක්‍රියාත්මක කිරීම පියවර ගත යුතුව තිබූ අතර ඒ සඳහා රු.මිලියන 03 ක් වෙන්කර තිබුණි. කෙසේ වුවද, නව පුහුණු පාඨමාලා හඳුනාගැනීම, සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන තිබූ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවිනි.

(iii) සමාලෝචිත වර්ෂය සඳහා වූ ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පරිදි, ශ්‍රම වෙළඳපල අවශ්‍යතා සපුරාලීම සඳහා වාර්ෂිකව නව පුහුණු පාඨමාලා හඳුන්වාදී ක්‍රියාත්මක කල යුතු අතර එම පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම වැඩිකල යුතුව තිබුණි. කෙසේ වුවද, ජාතික තරුණ සේවා සභාවේ රිකිල්ලගස්කඩ හා දෙහිඅත්තකණ්ඩිය පුහුණු මධ්‍යස්ථානවල පමණක් සමාලෝචිත වර්ෂය තුල නව පාඨමාලා හඳුන්වාදීමට කටයුතු කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඊ) ජාතික තරුණ සේවා සභාවේ හා වෘත්තීය පුහුණු අධිකාරියේ විස්තරාත්මක ක්‍රියාකාරකම් සැලසුම අනුව, වර්ෂ 2014 සිට 2020 දක්වා කාලසීමාව තුල අඩු වරප්‍රසාද සහිත සිසුන් 2,100 වෙනුවෙන් මූල්‍ය සහාය ලබා දීම සඳහා රු.මිලියන 1,144.80 ක මුදලක් වෙන්කර තිබුණි. කෙසේ වුවද, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(උ) වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වශයෙන් නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා මට්ටම වැඩිකරලීම සඳහා පෞද්ගලික රාජ්‍ය හවුල්කාරීත්වයන් දිරිගැන්වීමට අවශ්‍ය පියවර ගැනීමට වගකිව යුතු වේ. තවද, ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන්වල මට්ටම් 05 හා 06 සපුරාගැනීම සඳහා හා ඉල්ලුමක් සහිත අධ්‍යාපන පාඨමාලා ඉදිරිපත් කරලීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ගිවිසුමේ ඇතුළත් ආයතනද ඇතුලත්ව විශ්වවිද්‍යාල විද්‍යායතන පිහිටුවීම සඳහා වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාලයට සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 07 වෙන්කර තිබුණි.

කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුල නව විශ්වවිද්‍යාල විද්‍යායතන පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, වෘත්තීය පුහුණු අධිකාරිය හා ජාතික තරුණ සේවා සභාව සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 367.98 ක් පිරිවැය වූ සිවිල් ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත් 09 ක් ප්‍රදානය කර තිබුණි. ඉන් කොන්ත්‍රාත් 05 ක් 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට බලාපොරොත්තු වුවද, කොන්ත්‍රාත්කරුවන්ගේ මානව හා අනෙකුත් සම්පත් හිඟකම හා මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් නිදහස් කිරීමට කල්ගත වීම ආදිය නිසා එහි වැඩ 2018 ජුනි 30 වන විටත් අවසන් කර නොතිබුණි.

(ආ) වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා රු.මිලියන 295.77 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ගොඩනැගිලි 02 ක් ඉදිකිරීම සඳහා 2014 අගෝස්තු 05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබුණද, ඉඩම් පවරා ගැනීමේ කාර්යයන් ප්‍රමාද වීම හා තීරණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධිකාරියේ කළමනාකරණයේ මේ පිළිබඳව තිබූ මත ගැටුම නිසා එහි කටයුතු 2017 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඇ) අහංගම හෝටල් පාසල ප්‍රතිසංස්කරණය කිරීමේ මූලික සැලසුම පසුව එය ආදර්ශ හෝටලයක් ලෙස සංවර්ධනය කිරීමට වෙනස් කර තිබූ අතර, එම නිසා 2014 ඔක්තෝබර් 24 දින පිරිවැය රු.මිලියන 110.35 කට ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත්තුවද පසුව රු.මිලියන 122.75 ක් දක්වා වැඩි කර තිබුණි. තවද, 2017 නොවැම්බර් 14 දින හෝටලය සඳහා මුළුතැන්ගෙයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 4.92 කට වෙනමම කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. මෙම තීරණ වෙනස්කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, 2015 හා 2016 වර්ෂවල රු.මිලියන 10.93 ක පිරිවැයකට මිලදී ගත් පුහුණු උපකරණ 2018 ජුනි 30 දින වන විටත් වෘත්තීය පුහුණු අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලයේ නිෂ්ක්‍රීයව පැවතුණි. මීට අමතරව, 2018 ජුනි 30 දින වන විටත් ඉදිකිරීම් වැඩ අවසන් වී නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය තුල මිලදීගත් පිරිවැය රු.මිලියන 13.52 ක් වූ ලී බඩු, සවිකිරීම් හා හෝටල් උපකරණ නිෂ්ක්‍රීයව පැවතුණි.ලැබී තිබුණු තොරතුරු අනුව, මෙය හෝටලයක් ලෙස නඩත්තු කිරීම සඳහා අධිකාරියට මෙහෙයුම් හා මූල්‍ය ශක්තිය නොමැති වීම නිසා මෙම දේපල තුන්වන පාර්ශවයකට බදුදීම සඳහා කටයුතු සිදුකරමින් පැවතුණි. ඉහත තොරතුරු සලකා බැලීමේදී මේ සම්බන්ධයෙන් කරන ලද ආයෝජනයේ අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමේ හැකියාව පිළිබඳ විගණනයට ගැටළුකාරී තත්ත්වයක පැවතුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලද තොරතුරු අනුව, මෑතක සිට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පවතින කාර්ය මණ්ඩලය ඉවත්වීමේ ඉහළ අනුපාතය ව්‍යාපෘතියේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපා තිබුණි. තවද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ප්‍රසම්පාදන විශේෂඥ (Procurement Specialist), පරිසර ආරක්ෂක නිලධාරී (Environment Safe Guard Officer) සහ මූල්‍ය විශ්ලේෂක (Financial Analysts) ආදී තනතුරු සමාලෝචිත වර්ෂය පුරාවටම පුරප්පාඩුව පැවතුණු බව නිරීක්ෂණය විය.

(ආ) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය යටතේ පිහිටවනු ලැබූ විශ්වවිද්‍යාල විද්‍යායතන 06 ක් සඳහා අවශ්‍ය වූ දේශකවරු 31 ක්, ප්‍රදර්ශකවරු 21 ක් (Demonstrators) පසුගිය වර්ෂ 02 කට වැඩි

කාලයක් තුල බඳවා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද, 2017 දෙසැම්බර් 31 දිනට ජාතික තරුණ සේවා සභාවේ කාර්මික හා වෘත්තීය පුහුණු අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 59 ක පුරප්පාඩු හා අධ්‍යක්ෂ තනතුර (පුහුණු) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ හා වෘත්තීය පුහුණු) තනතුර වර්ෂයකට වැඩි කාලයක් පුරවා නොතිබුණි.

(ඇ) අදාල මිනුම්දඬු මත කාර්යසාධනය ඇගයීමකින් තොරව රේඛීය අමාත්‍යාංශ විසින් හඳුන්වාදී තිබූ වැරදි අර්ථකථනයක් සහිත පටිපාටියක් මත ජාතික තරුණ සේවා සභාවේ, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ, වෘත්තීය පුහුණු අධිකාරියේ හා සාගර විශ්වවිද්‍යාලයේ අධ්‍යයනික කාර්ය මණ්ඩලයට නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 133.29 ක කාර්යසාධන දීමනා ගෙවා තිබූ බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය වෙනුවෙන් රු.මිලියන 01 ක් වෙන්කර තිබුණද, පුහුණු වැඩසටහන් 03 ක් යටතේ උපදේශකවරු 11 ක් පමණක් පුහුණු කර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 0.29 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඉ) වෘත්තීය පුහුණු අධිකාරිය සඳහා 2017 දෙසැම්බර් 31 දින වන විටත් මානව සම්පත් සංවර්ධන සැලසුමක් පිළියෙල කර නොතිබූ අතර අධිකාරියේ උපදේශකවරුන්ගේ අවශ්‍ය සුදුසුකම් සහිත දත්ත සමුදායක් නඩත්තු කර නොතිබුණි.

**3.5 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජන වත්කම්**

----------------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරීක්ෂණාගාර ඉදිකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමේ ප්‍රමාදය නිසා බටන්ගල විශ්වවිද්‍යාල විද්‍යායතනයට මිලදී ගෙන තිබූ රු.මිලියන 59.53 වටිනා පුහුණු උපකරණ වර්ෂ 03 කට වැඩි කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ පවතින වාර්තා අනුව, 2015 ජූලි 02 දින රු.මිලියන 1.92 කට මිලදීගත් පරිගණක 18 ක් බටන්ගල විශ්වවිද්‍යාල විද්‍යායතනයට මාරු කර තිබුණි. කෙසේ වුවද, ලැබී ඇති තොරතුරු අනුව අදාල වත්කම 2018 මැයි 31 දින වන විටත් බටන්ගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ භාෂා පරීක්ෂණාගාරයට ලැබී නොතිබුණු අතර මේ පිළිබඳ පරීක්ෂා කිරීමට පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය 2016 වර්ෂයේදී පිරිවැය රු.මිලියන 99.57 කට මිලදීගත් උපකරණ අයිතම 66 ක් නිෂ්පාදන තාක්ෂණ පුහුණු පාඨමාලාව ආරම්භ කිරීම සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට පවරා තිබුණි. කෙසේ වුවද, 2018 මැයි වන විටත් අදාල පාඨමාලාව ආරම්භ කර නොතිබූ අතර 2018 මැයි 29 දින වන විට අදාල උපකරණ වර්ෂ 1 ½ කට වැඩිකාලයක් ඌන උපයෝජන තත්ත්වයක පැවතුණි. තවද, මෙම උපකරණවල වගකීම් කාලය ඉක්ම ගොස් තිබුණි.

## 3.6 මූල්‍ය පාලන ගැටළු

-----------------------

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක 02/2016 හා 2016 ජුනි 10 දිනැති චක්‍රලේඛය පරිදි, 2017 දෙසැම්බර් 31 දින දක්වා වැඩසටහනට අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මහ පෙන්වීම්හි 4.2.1 පරිච්ඡේදය හා අන්තර්ජාතික සංවර්ධන සංගමයේ භාණ්ඩ වැඩ සහ උපදේශක සේවා නොවන ප්‍රසම්පාදන මහ පෙන්වීම්හි 1.18 වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 751 අනුව, වැඩසටහනේ වත්කම් සටහන් කිරීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය ඉන්වෙන්ට්‍රි ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. එමනිසා, ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය අදාල ක්‍රියාත්මක කිරීමේ ආයතනවලට මාරුකරන ලද වත්කම්වලට අදාල තොරතුරු සත්‍යාපන කටයුතු සඳහා පහසුවෙන් ලබාගත නොහැකි විය. මීට අමතරව, රේඛීය අමාත්‍යාංශයෙන් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයට සමාලෝචිත වර්ෂය තුලදී මාරුකරන ලද පිරිවැය රු.මිලියන 2.76 ක් වටිනා වත්කම් සම්බන්ධයෙන් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය වාර්තා නඩත්තු කර නොතිබුණි.

(ඈ) වැඩසටහන මගින් බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයට පවරා දී තිබූ ඉන්වෙන්ට්‍රි අයිතම 40 ක් විශ්වවිද්‍යාල විද්‍යාතනය නඩත්තු කරනු ලබන ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි.